WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතර ව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

## I කොටස

● අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** ශ්‍රී ලංකාවේ ජන ජීවිතය හා බැඳි වෘත්තීන් සම්බන්ධව නිර්මාණය වී ඇති ගැමි නැටුම් වශයෙන් ........................... නැටුම් සැලකිය හැකි ය.
(1) චාමර, වේවැල්, ගොයම්
(2) සවරම්, වේවැල්, ගොයම්
(3) මෝල්ගස්, කුලු, ගොයම්
(4) මෝල්ගස්, ලී, කුලු

**2.** "උඩරට නැටුම් කලාව" කෘතිය ලියා පළ කොට ඇත්තේ ........................... මහතා විසිනි.
(1) මුදියන්සේ දිසානායක
(2) ජේ. ඊ. සේදරමන්
(3) ඩබ්ලිව්. බී. මකුලොලුව
(4) කේ. එස්. ප්‍රනාන්දු

WWW.OLEVELAPI.COM

**3.** කෝලම් නාටක චරිත නිරූපණයේ දී ........................... අධි මානුෂ චරිත ලෙස සැලකේ.
(1) නාග රාක්ෂ, නාග කන්‍යා, සිංහ
(2) නාග රාක්ෂ, නාග කන්‍යා, කාපිරි
(3) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, වලස්
(4) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නාග කන්‍යා

**4.** රජයේ පාසල්වල සෞන්දර්ය විෂයය අනිවාර්ය කෙරුණේ ........................... වර්ෂයේ දී ය.
(1) 1972
(2) 1974
(3) 1978
(4) 2005

**5.** "ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ" මෙම කවි පදය අයත් වන්නේ ග්‍රහයන් සඳහා කෙරෙන ........................... ශාන්තිකර්මයට ය.
(1) කොහොඹා
(2) මඩු
(3) බලි
(4) සූනියම්

**6.** "තව ද අත්තා මුත්තා නත්තා පනත්තා ..." මෙම පද කොටස අයත් ගායනය ........................... කි.
(1) වන්නම
(2) ඊකාව
(3) ප්‍රශස්තිය
(4) සැහැල්ල

**7.** රත්නපුර සමන් දේවාල පෙරහැරේ දී ........................... නැටුම්වලට විශේෂ තැනක් හිමි වේ.
(1) සබරගමු
(2) උඩරට
(3) කාවඩි
(4) පහතරට

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**8.** විලම්භ, මධ්‍ය හා ....................... ලයට නර්තන අභ්‍යාස කිරීමෙන් ප්‍රායෝගික කුසලතා වර්ධනය වේ.
(1) නෘත (2) ධෘත (3) ප්ලුත (4) වෘත

**9.** "ඉතින් කියන්නේ තුන්වැනි වරට නටන්නේ - ......................... එන්නේ වට පිට නිතර බලන්නේ"
ඉහත දැක්වෙන ජන නාටක කවි පදයේ හිස්තැනට ගැළපෙන වචනය කුමක් ද?
(1) සොකරි (2) වෙදා (3) පරයා (4) ගුරුවා

**10.** පොළොන්නරුවේ සරස්වතී මණ්ඩපය ඉදි කරන ලද්දේ ............................ රජු ය.
(1) I පරාක්‍රමබාහු (2) නිශ්ශංකමල්ල (3) II රාජසිංහ (4) දුටුගැමුණු

**11.** පිළිවෙළින් **විශ්මය** සහ **ශාන්ත** රසය දැක්වෙන්නේ,


A


B


C

(1) A සහ C ඡායාරූපවල ය.
(2) A සහ B ඡායාරූපවල ය.
(3) B සහ C ඡායාරූපවල ය.
(4) B සහ A ඡායාරූපවල ය.

**12.** "චිත්තරාජ නම් යක්ෂයා සමග සම අසුන් ගෙන දෙව් මිනිස් නැටුම් නැරඹූ බව සඳහන් වන්නේ,
(1) පණ්ඩුකාභය රජු ය.
(2) දුටුගැමුණු රජු ය.
(3) පඬුවස්දෙව් රජු ය.
(4) පරාක්‍රමබාහු රජු ය.

**13.** පාසල් නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පිනියක් ලෙස නම් කළ හැක්කේ,
(1) වජිරා චිත්‍රසේන ය.
(2) මීරියම් පීරිස් ය.
(3) මිරැන්ඩා හේමලතා ය.
(4) චන්ද්‍රලේඛා පෙරේරා ය.

**14.** ශාන්තිකර්මවල භාවිත කෙරෙන දෙබස් සංවාද අයත් වන්නේ,
(1) ආංගික අභිනයට ය.
(2) සාත්වික අභිනයට ය.
(3) ආහාර්ය අභිනයට ය.
(4) වාචික අභිනයට ය.

**15.** මාත්‍රා 2 + 2 + 3 යන තාල රූපය හඳුන්වන්නේ,
(1) දෙසුළු මහ තුන්තිත ලෙස ය.
(2) සුළු මැදුම් මහ තුන්තිත ලෙස ය.
(3) දෙසුළු මැදුම් තුන්තිත ලෙස ය.
(4) දෙමැදුම් මහ තුන්තිත ලෙස ය.

WWW.OLEVELAPI.COM

**16.** සකපෝරුව භාවිත වන්නේ,
(1) කෘෂි කර්මාන්තය සඳහා ය.
(2) මැටි කර්මාන්තය සඳහා ය.
(3) පතල් කර්මාන්තය සඳහා ය.
(4) තේ කර්මාන්තය සඳහා ය.

**17.** ආගමික කටයුතු සඳහා භාවිත වාදන අවස්ථා ලෙස සැලකෙන්නේ,
(1) අණ බෙර සහ රණ බෙර වාදන ය.
(2) රණ බෙර සහ මඟුල් බෙර වාදන ය.
(3) හේවිසි සහ තේවා වාදන ය.
(4) මළ බෙර සහ වද බෙර වාදන ය.

**18.** නන්දිකේශ්වර විසින් රස භාව පිළිබඳ පළ කරන ලද කෘතිය වන්නේ,
(1) නාට්‍ය ශාස්ත්‍රය ය.
(2) අභිනය දර්පණය ය.
(3) භගවත්ගීතාව ය.
(4) සීලප්පදිකාරම් ය.

**19.** පංච තූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දී **අතත** හා **විතත** කාණ්ඩයට ගැනෙන්නේ,
(1) රබාන සහ තම්මැට්ටමයි.
(2) රබාන සහ තාලම්පටයි.
(3) ගැටබෙරය සහ දවුලයි.
(4) ගැටබෙරය සහ තාලම්පටයි.

/තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**20.** A සහ B ඡායාරූපවලින් දැක්වෙන චරිත පිළිවෙළින්,



A



B

(1) වෙදරාළ-සොකරි සහ තොන්වි-හෙන්වා-මුදලි ය.
(2) පරයා-සොකරි සහ ලෙන්චිනා-හෙන්වා-මුදලි ය.
(3) සොකරි-ගුරුවා සහ ජස-ලෙන්චිනා-මුදලි ය.
(4) වෙදරාළ-සොකරි සහ ලෙන්චිනා-හෙන්වා-මුදලි ය.

**21.** වන්නම් සහ සින්දු වන්නම් නැටීමේ දී එහි පද නර්තනයට යොදා ගනු ලබන්නේ,
(1) ප්‍රකාශනාත්මක චලන වේ. (2) තාලානුකූල චලන වේ.
(3) රිද්මයානුකූල චලන වේ. (4) භාවාත්මක චලන වේ.

● ප්‍රශ්න අංක **22** සහ **23** සඳහා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| A | තබ්ලාව | මෘදංගය | මංජිරා | චෙන්ඩාව |
| B | ලෙහෙඟා | ඇසෑමය | දෘපට්ටා | කේරළය |
| C | කොක්තුම්බි | රාක්කුඩි | කිරීටම් | උත්තරීයම් |

**22.** භරත සහ කථකලි නර්තනයට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ දැක්වෙන්නේ,
(1) C පේළියේ 1 හා 3 තීරුවේ ය. (2) A පේළියේ 2 හා 3 තීරුවේ ය.
(3) A පේළියේ 2 හා 4 තීරුවේ ය. (4) B පේළියේ 1 හා 2 තීරුවේ ය.

**23.** මණිපුරි සහ කථකලි නර්තනයට පළඳිනු ලබන ආභරණ දැක්වෙන්නේ,
(1) C පේළියේ 2 හා 4 තීරුවේ ය. (2) C පේළියේ 1 හා 3 තීරුවේ ය.
(3) C පේළියේ 2 හා 3 තීරුවේ ය. (4) B පේළියේ 1 හා 3 තීරුවේ ය.

**24.** "මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ …………" යන ගායනය,
(1) ප්‍රශස්තියකි. (2) හටන් කවියකි. (3) ජන ගීයකි. (4) නූර්ති ගීයකි.

**25.** චිත්‍රසේන කලායතනය මගින් නිෂ්පාදනය කරන ලද නවතම මුද්‍රා නාට්‍යයක් ලෙස සැලකෙන්නේ,
(1) නල දමයන්ති ය. (2) කරදිය ය.
(3) කුඹි කතාව ය. (4) කිංකිණී කෝලම ය.

**26.** නළඟන රූප ඇතුළත් ලී කැටයම් ගණනාවක් දැකිය හැක්කේ,
(1) ගඩලාදෙණිය විහාරයේ ය. (2) ඇම්බැක්ක දේවාලයේ ය.
(3) යාපහුව මාලිගයේ ය. (4) ලෝවාමහපායේ ය.

WWW.OLEVELAPI.COM

**27.** ප්‍රාසංගික නර්තන කණ්ඩායමක්, වේදිකාවක නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ දී වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ,
(1) අවකාශය හා රංග රටා භාවිතයට ය. (2) අවකාශය හා තාල රටා භාවිතයට ය.
(3) සැරසිලි හා වාදන රටා භාවිතයට ය. (4) සැරසිලි හා ගායන විධි භාවිතයට ය.

**28.** මහනුවර දළදා පෙරහැරේ චාරිත්‍ර විධි ආරම්භ වන්නේ,
(1) දිය කැපීමෙනි. (2) රන්දෝලි පෙරහැරෙනි. (3) කප් සිටුවීමෙනි. (4) කුඹල්පෙරහැරෙනි.

**29.** අඹරා හේවිසි සහ ගෙවැදුම් හේවිසි යන ශබ්ද පූජා විශේෂය පවත්වනු ලබන්නේ,
(1) යාපහුව මාලිගයේ ය. (2) කතරගම දේවාලයේ ය.
(3) නාථ දේවාලයේ ය. (4) දළදා මාලිගයේ ය.

**30.** සීතාහරණ නෘත්‍ය නාටකය නිෂ්පාදනය කරන ලද්දේ,
(1) රවීන්ද්‍රනාත් තාගෝර්තුමා ය. (2) නිමල් වෙල්ගම ය.
(3) ශාන්ති දේව් ඝෝෂ් ය. (4) උදය ශංකර් ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## II කොටස - උඩරට නර්තනය

**31.** උඩරට නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීමට උපයෝගී වන්නේ,
(1) පා සරඹ සහ ඉලංගම් සරඹ ය. (2) දොඹින පද සහ ඉලංගම් සරඹ ය.
(3) පා සරඹ සහ දොඹින පද ය. (4) පා සරඹ සහ ගොඩ සරඹ ය.

**32.** ගැටබෙර වාදනයට අදාළ වන පද කොටස් වන්නේ,
(1) දොං ජිං ජිං තකට දොංතක (2) ජෙං ජෙඟක් කිට ජෙඟක්
(3) ගුංද ගත්ගත ගත්ත ගුග්ගුඳ (4) කිත්තත් කිත්තත් කිත්තත් ජෙං ජෙං

**33.** "තක් තකට තක රොං තක්කඩ තක්කඩ කුඳ තක රොං ....." මෙය,
(1) කස්තිරමකි. (2) කලාසමකි. (3) අඩව්වකි. (4) සීරුමාරුවකි.

**34.** සැව්ලා වන්නමේ පළමු කවි පදය ආරම්භ වන්නේ,
(1) සහ ගොස් කළ යුදෙන් (2) බලයුත් සැවතිඳුන්
(3) සුරිඳුන් පෙර සිටන් (4) අසුරන් ජය නොලදින්

**35.** මෙම **කස්තිරම** සම්පූර්ණ කිරීමට පහත සඳහන් වරණ අතුරෙන් ගැළපෙන පදය තෝරන්න.
"ගත්තකු ජිත්තම් ගජිතකු .................... තරිකිට ජිත් ................ දොම්කිට තා"
(1) කුංදත් - කුංදත් (2) ජිත්තම් - තරිකිට
(3) ජිත්තම් - තක්කඩ කුඳ (4) ජිංගත් - දොද්දොංගත

**36.** "වන පැත්ත බිය පත්ව සයනම්" මෙම කවි පදය ඇතුළත් වන්නේ,
(1) සැව්ලා වන්නමට ය. (2) සිංහරාජ වන්නමට ය.
(3) මුසලඩි වන්නමට ය. (4) වෛරෝඩි වන්නමට ය.

**37.** ශිඛාබන්ධනය, නෙත්තිමාලය හා පායින්පත අයත් වන්නේ,
(1) නයියන්ඩි ඇඳුම් කට්ටලයට ය. (2) පන්තේරු ඇඳුම් කට්ටලයට ය.
(3) උඩැක්කි ඇඳුම් කට්ටලයට ය. (4) වෙස් ඇඳුම් කට්ටලයට ය.

**38.** 'මඩුපුරය' නර්තනයට ගැනෙන රංග භාණ්ඩය වන්නේ,
(1) පොල්මලයි. (2) ඊ තලයයි. (3) කොතලයයි. (4) වංගෙඩියයි.

**39.** උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ගායනය සහිත නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) ආවැන්දුම, දුනුමාලප්පුව හා යක් ඇනුම වේ. (2) අස්නේ, මඩුපුරය හා කොහොඹාහැල්ල වේ.
(3) ආවැන්දුම, මඩුපුරය හා යක් ඇනුම වේ. (4) අස්නේ, දුනුමාලප්පුව හා කොහොඹාහැල්ල වේ.

**40.** කුදාංත ගත දොම් වට්ටමේ "තත් තොග තක තොග ...... " ආදී වශයෙන් නටන අඩව්ව අයත් තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 2 + 3 තුන්තිත ය. (2) මාත්‍රා 3 + 2 + 4 තුන්තිත ය.
(3) මාත්‍රා 2 + 2 + 4 තුන්තිත ය. (4) මාත්‍රා 2 + 3 + 4 තුන්තිත ය.

## III කොටස - පහතරට නර්තනය

**31.** පහතරට නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීමට උපයෝගී වන්නේ,
(1) පා සරඹ සහ ගොඩ සරඹ ය. (2) ඉලංගම් සරඹ සහ දොඹින පද ය.
(3) පා සරඹ සහ දොඹින පද ය. (4) පා සරඹ සහ ඉලංගම් සරඹ ය.

WWW.OLEVELAPI.COM

**32.** පහතරට බෙර වාදනයට අදාළ වන පද කොටස් වන්නේ,
(1) දිත්තම් දිතකු දොම් දොම් තා (2) ජෙං ජෙඟත් තතු ජෙඟත්
(3) කුංත ගජිගත ගත්ත කුජිගත (4) කිත්තත් කිත්තත් කිත්තත් ජෙං ජෙං

**33.** "ගු-ඳ ග-ති ග-ත ගු-ඳ ගත්-තම්" මෙය,
(1) කලාසමකි. (2) ඉරට්ටියකි. (3) අන්තාඩියකි. (4) කස්තිරමකි.

**34.** නාතිලිංචි තාලය සින්දු වන්නමේ පළමු කවිය ආරම්භ වන්නේ,
(1) සඳ සන්දර පැරදුන මෙන් (2) දිළිමන් ඔබ යසටා
(3) සඳ සන්දර දිගු පුන්ගිර (4) සැඟවී මෙර ගිරටා

**35.** මෙම **ඉරට්ටිය** සම්පූර්ණ කිරීමට පහත සඳහන් වරණ අතුරෙන් ගැළපෙන පදය තෝරන්න.
"රෙගුඳ ......... ගත ......... රෙගුඳකු දොම්"
(1) ගදිත - ගදිංත දිත (2) ගදිත - ගුදිතග
(3) ගදිත්ත - ගදිත්ත (4) රෙගුඳ - ගත්තත්

/පස්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

36. "තාරගනා මැදිනා දිසි" මෙම කවි පදය ඇතුළත් වන්නේ,
(1) හනුමන්තා තාලයට ය. (2) නාතිලිංචි තාලයට ය.
(3) අනුරාගදණ්ඩ තාලයට ය. (4) ශුද්ධ තාලයට ය.

37. නළල් පටිය, පබළු හැට්ටය හා තෙල් කච්චිය අයත් වන්නේ,
(1) සන්නි ඇඳුම් කට්ටලයට ය. (2) දෙවොල් ඇඳුම් කට්ටලයට ය.
(3) වඩිගපටුන ඇඳුම් කට්ටලයට ය. (4) තෙල්මේ ඇඳුම් කට්ටලයට ය.

38. දුම්මල පාළිය නර්තනයට ගැනෙන රංග භාණ්ඩය,
(1) අඟුරු කබලයි. (2) ඊ තලයයි. (3) කොතලයයි. (4) පන්දමයි.

39. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) තෙල්මේ, ආවැන්දුම හා ශුද්ධමාත්‍රා වේ. (2) තෙල්මේ, දෙවොල් හා ශුද්ධමාත්‍රා වේ.
(3) නානුමුරය, අස්නේ හා ශුද්ධමාත්‍රා වේ. (4) දෙවොල්, අස්නේ හා ශුද්ධමාත්‍රා වේ.

40. "තත් ගුඳ ගත තිත් තිත් තෙයි ......" වශයෙන් නටන ඉරට්ටිය අයත් තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 2 + 4 තුන්තිත ය. (2) මාත්‍රා 2 + 3 දෙතිත ය.
(3) මාත්‍රා 2 + 2 + 3 තුන්තිත ය. (4) මාත්‍රා 2 + 4 දෙතිත ය.

## IV කොටස - සබරගමු නර්තනය

31. සබරගමු නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීමට උපයෝගී වන්නේ,
(1) පා සරඹ සහ ඉලංගම් සරඹ ය. (2) ඉලංගම් සරඹ සහ දොඹින පද ය.
(3) අත් සරඹ සහ දොඹින පද ය. (4) මණ්ඩි පද සහ දොඹින පද ය.

32. දවුල් වාදනයට අදාළ වන පද කොටස් වන්නේ,
(1) කුඳත් තක්කිට තකට ජිම්තකු (2) දිත්තම් දිතකු දොම් දොම්තා
(3) දොං ජිං ජිං තකට දොංතක (4) කුංත ගත ගත ගත්ත කුඳ කුඳ

33. "කුඳිත ගත ගත ගතිත කුඳ කුඳ /// කුඳිත තත් කුඳ ගඳිත කුඳ දොං " මෙය,
(1) වට්ටමකි. (2) අඩව්වකි. (3) කලාසමකි. (4) ඉරට්ටියකි.

34. විරාඩි වන්නමේ පළමු කවි පදය ආරම්භ වන්නේ,
(1) බූනා රජසිත් එක ලෙස (2) කුළුණෙන් හිඳ වාරාඩි
(3) පානා යසසින් සිරිපිරි (4) වන්නම දනු විරාඩි

35. මෙම **අඩව්ව** සම්පූර්ණ කිරීමට පහත සඳහන් වරණ අතුරෙන් ගැළපෙන පදය තෝරන්න.
"තාත් ............... තකට .............. කිනම් තත්ජිත්"
(1) ගජ්ජිත් - තකුකුකු (2) තත්ජිත් - තත්ජිත්
(3) ජිංතක් - ගත්තත් (4) ගජ්ජිත් - ජිත්ජිත්

36. "අවිය රැගෙන යුධයට ආ විලසට" මෙම කවි පදය ඇතුළත් වන්නේ,
(1) සැව්ලා වන්නමට ය. (2) අනිලා වන්නමට ය.
(3) මණ්ඩූක වන්නමට ය. (4) විරාඩි වන්නමට ය.

WWW.OLEVELAPI.COM

37. රතු හැට්ටය, කාඟුල් හා අත්පොට හතර අයත් වන්නේ,
(1) අඹ විදමන ඇඳුම් කට්ටලයට ය. (2) තෙල්මේ ඇඳුම් කට්ටලයට ය.
(3) සන්නි ඇඳුම් කට්ටලයට ය. (4) දෙවොල් ඇඳුම් කට්ටලයට ය.

38. දුම්මල පාළිය නර්තනයට ගැනෙන රංග භාණ්ඩය,
(1) අඟුරු කබලයි. (2) ඊ තලයයි. (3) කොතලයයි. (4) පන්දමයි.

39. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) තෙල්මේ, වඩිග පටුන හා පට්ටුතාල් මාත්‍රයයි. (2) මුදුන් තාලය, යහන් දැක්ම හා දේවකෝල්පාඩුවයි.
(3) තෙල්මේ, තෝරංගම හා පට්ටුතාල් මාත්‍රයයි. (4) මුදුන් තාලය, යහන් දැක්ම හා කෝල්පාඩුවයි.

40. "තහර් ද තත් තත් තතත් තත් තත් ........." වශයෙන් නටන අඩව්ව අයත් තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 2 + 2 තනිතිත ය. (2) මාත්‍රා 2 + 3 දෙතිත ය.
(3) මාත්‍රා 3 + 2 + 2 තුන්තිත ය. (4) මාත්‍රා 3 + 3 + 4 තුන්තිත ය.

**

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....